
# නූතන අධ්‍යාපනයට මහඟු අත්වැලක් වූ Microsoft PowerPoint ඉදිරිපත්කිරීම්




අයෝම ජයසිංහ

**නව තාක්ෂණයත් සමග ඉදිරියට යාම සඳහා 'දැනුම' බෙහෙවින් උපකාරී වේ. දැනුමින් සපිරුණු පුද්ගලයන්, ඔවුන්ගේ 'දැනුම' දැනුම නොමැත්තන් හට ප්‍රදානය කිරීම, අධ්‍යාපනය යනුවෙන් සමහරු හඳුන්වති.**

මිනිස් ශිෂ්ඨාචාරය ආරම්භයේ සිටම අධ්‍යාපනය මගින් දැනුම ඉදිරි පරම්පරාවට බෙදාහැරීම සිදු කරනු ලබයි. දැනුම එක් පාර්ශවයක සිට තවත් පාර්ශ්වයකට සම්ප්‍රේෂණය වීම විවිධ ආකාරයෙන් සිදු වේ.

පාසලක ගුරුවරයා විසින් තම ගෝලයින්ට දැනුම කියාදීම, පොත් පුවත් සඟරා මගින් දැනුම බෙදාදීම, රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් මගින් දැනුම ලබාදීම, අන්තර්ජාලයෙන් දැනුම ලබාදීම, මෙයින් ප්‍රධාන මාධ්‍යයන් වේ.

මෙහි දක්වා ඇති 'පාසල්' මාධ්‍යයට සමාන වූ මාධ්‍යයකි දේශන ක්‍රමය. දේශනයකදී සිදුවන්නේ පළපුරුදු දැනුම ඇත්තෙකු විසින් තම දැනුම එකවර පුද්ගලයින් රාශියකට සම්ප්‍රේෂණය කිරීමයි.

එම දේශනය ඕනෑම මාතෘකාවක් පිළිබඳ කලින් සකසා ගත් එකක් විය හැක. තමාට කිව යුතු දේ ඔහුට හැකි අයුරින් රසවත් කර අසන්නාට ඉදිරිපත් කිරීම ඔහුගේ කාර්යභාරයයි.

මෙම දේශනය ඉදිරිපත් කිරීම සඳහා දේශකයා විසින් පරිගණක තාක්ෂණය උපයෝගී කරගතහොත්, වඩා හොඳ යැයි සිතේ. මෙවැනි ඉදිරිපත් කිරීමක් සඳහා 'Microsoft' ආයතනය මගින් නිර්මාණය කරනු ලැබූ සිතගන්නා සුළු මෘදුකාංගයක් ලෙස 'Office xp' යටතේ පැමිණෙන Powerpoint xp හැඳින්විය හැකිය.


Powerpoint xp මගින් තමා ඉදිරිපත් කළයුතු දේශනය ඉතා කෙටියත් ද, රසවත් ලෙස හා ඒ වෙත ප්‍රේක්ෂකයා බැඳ තබාගන්නා අයුරින් නිර්මාණය කරගැනීමට, දේශකයාට අවස්ථාවක් ලැබේ.

දේශනයකට පෙර මෙවැන්නක් නිර්මාණය කර තබා පෙර සූදානමකින් සිටිය යුතු ය. මෙහිදී සිදුවන්නේ තම නිර්මාණය අඩංගු සංයුක්ත තැටිය (CD) දේශකයා විසින් දේශන ශාලාවේ තබා ඇතිWindows xp පිහිටුවාගත් පරිගණකයකට ඇතුළු කිරීමයි. එහි Start—-Programes යටතේ ඇති Office xp මෘදුකාංගය විවෘත කරගත් පසු, File——-Open මගින් සංයුක්ත තැටියේ අඩංගු Powerpoint නිර්මාණය විවෘත කිරීම සිදු කෙරේ.

ඉන් අනතුරුව පරිගණකයෙන් පිටතට යැවෙන සංඥා (Output signals) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් උපයෝගී කරගෙන (Multimedia Projector) දේශන ශාලාවේ කොනක සවිකර ඇති විශාල තිරයක් මතට පතිත කිරීම සිදුකරනු ලබයි.

ඉන්පසු සිදුකළ යුතු එකම කාර්යය වන්නේ, දේශකයා විසින් 'මවුස් බොත්තම' Click කිරීම මගින් කලින් සකසාගත් නිර්මාණයේ පිටු එකින් එක පෙරලීමයි.

සාමාන්‍ය දේශනයකට වඩා මෙවැනි ඉදිරිපත් කිරීමක් මගින් ලැබෙන වාසි කීපයකි. අනවශ්‍ය කරුණුවලට වඩා අවශ්‍ය කරුණු කෙටියෙන් ඉදිරිපත් කිරීමත්, වාචික දේශනය හැකිතරම් දුරට අඩුකර අවශ්‍ය නම් එය පටිගත කර පසුබිමින් ඇසීමට සැලැස්වීමත් පෙන්වා දිය හැකිය.




## Powerpoint Presentation එකක් මගින් ලද හැකි අමතර වාසි


(1) දේශනය හෝ පාඩම් මාලාව පිටුවෙන් පිටුවට පෙරලී යන අන්දමට සකස් කිරීමේ පහසුකම

(2) අක්ෂර (ඕනෑම භාෂාවකින්) යෙදීම හා අවශ්‍ය නම් ඒවා සජීවිකරණය කිරීමේ හැකියාව

(3) ඡායාරූප සහ ග්‍රැෆික්ස් ඇතුළත් කිරීම සහ අවශ්‍ය නම් සජීවිකරණය කිරීම

(4) මුළු දේශනයම හෝ දේශනයෙන් තෝරාගත් කොටස් (කටහඬ) පටිගත කර පසුබිමින් වාදනය කිරීම

# පවර්පොයින්ට් පිටුවක ප්‍රධාන කොටස්




(5) සංගීතය හෝ ගීත කොටස් පසුබිමින් යෙදීම

(6) ශබ්දය සහිතව හෝ රහිතව වීඩියෝ දර්ශන (අඩු කාලයක් සහිත වීඩියෝ ක්ලිප්) ඇතුළු කිරීමේ හැකියාව

Buttons (බොත්තම) යෙදීම මගින් ඕනෑම දිශාවකට එනම්, අන්තර්ජාලයේ වෙබ් පිටුවකට වෙනත් Presentation ඉදිරිපත් කිරීමකට හෝ පරිගණකයේ ඕනෑම ෆයිල් ගොනුවකට ඔබව ගෙනයාමට ඇති පහසුකම

## Powerpoint ඉදිරිපත් කිරීමක් සඳහා උපයෝගී වන උපකරණ හා වෙනත් දේ

(1) Windows xp මෙහෙයුම් පද්ධතියක් සහිත පරිගණකයක්. මෙයට Office xp පැකේජය ඇතුළත් කර තිබිය යුතුය.

(2) Power point නිර්මාණයක් කිරීමට අවශ්‍ය දැනුම

(3) කටහඬ යෙදීම සඳහා පරිගණකයට සම්බන්ධ කළ මයික්‍රොෆෝනයක් (අවශ්‍ය නම්)

(4) වීඩියෝ ටේප් මගින් සංයුක්ත තැටියකට හරවා ගනු ලැබූ වීඩියෝ දර්ශන (අවශ්‍ය නම්) (VCD Cutter) නම් මෘදුකාංග මගින් මෙම දර්ශන තවදුරටත් සංස්කරණය කළ හැකිය.)

(5) CD-ROM (තැටි වාදකය)

(6) ඩිජිටල් කැමරාවක් මගින් හෝ ස්කෑන් යන්ත්‍රයක් මගින් හෝ අන්තර්ජාලයෙන් ලබාගත්තා ඡායාරූප

ඔබටත් යම් අදහසක් යමෙකුට ක්‍රමානුකූලව ප්‍රකාශ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා Powerpoint නිර්මාණශීලීව යොදාගත හැක. එහි Help මෙනුව මගින් හෝ අන්තර්ජාලයේ පාඩම් මගින් හෝ පොත්පත් මගින් හෝ Powerpoint ඔබට තනිවම ඉගෙන ගත හැක.

(7) වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක්

(මෙය අවසන් අවස්ථාව සඳහා පමණක් අවශ්‍ය වේ. සමහර ආයතන කුලී පදනම මත මේවා සපයයි.)

## Powerpoint හි නූතන යුගයේ අවශ්‍යතාව

නූතන යුගයේදී Powerpoint යන්න දේශනයකදී පමණක් සීමා නොවේ.

(1) අධ්‍යාපන ක්ෂේත්‍රයේදී

පාසලකදී කළුලෑල්ලක් මත චෝක් කූරු වලින් පාඩමක් කියාදෙන ක්‍රමයේ දියුණු අවස්ථාවක් වන්නේ මැජික් බෝඩ් එකක් (සුදු පැහැති ෆෝමිකා මාධ්‍යයක්) මත මාකර් පෑනකින් ලිවීමයි. ගුරුවරයා විසින් පරිගණක තාක්ෂණය මේ සඳහා ප්‍රයෝජනයට ගන්නේ නම් මුළු පාඩම සඳහාම Powerpoint ඉදිරිපත් කිරීමක් නිර්මාණය කළ හැකිය.

(2) අන්තර්ජාලයේදී

අන්තර්ජාලයෙන් ලැබෙන සමහර කෙටි නිවේදන හා ක්‍රියාකාරකම් Powerpoint මගින් නිමවා ඇත.

(3) පරිගණක අධ්‍යාපනයේදී

ඇතැම් පරිගණක මෘදුකාංග පිළිබඳව අන් අයට ඉගැන්වීමේදී සංයුක්ත තැටිගත කළ Powerpoint නිර්මාණ අද බෙහෙවින් ප්‍රයෝජනයට ගනී.

ඔබටත් යම් අදහසක් යමෙකුට ක්‍රමානුකූලව ප්‍රකාශ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා Powerpoint නිර්මාණශීලීව යොදගත හැක. එහිHelp මෙනුව මගින් හෝ අන්තර්ජාලයේ පාඩම් මගින් හෝ පොත්පත් මගින් හෝ Powerpoint ඔබට තනිවම ඉගෙන ගත හැක.

මය ඉගෙනගැනීමට කැමති අය සඳහා දැන් සිංහල භාෂාවෙන්ද පොත්පත් මුද්‍රණය කර ඇති අතර පහසු මිලකට ප්‍රධාන පෙළේ පොත්හල් වලින් ඔබට ඒවා ලබාගත හැකිය.

Powerpoint xp ආශ්‍රයෙන් Presentation එකක් සකස් කරන අන්දම ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.